www.agaram.lk



OL/2015/63-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | | |
|---|---|---|
| **ව්‍යවසායකත්ව අධ්‍යයනය** | **I, II** | **පැය තුනයි** |
| முயற்சியாண்மைக் கற்கை | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Entrepreneurship Studies | **I, II** | *Three hours* |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** ව්‍යවසායකයකු සිය ව්‍යාපාරය සඳහා පවත්නා අවස්ථා හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය කරනුයේ,
(1) අභ්‍යන්තර පරිසරය වේ. (2) තරගකරුවන් වේ.
(3) සැපයුම්කරුවන් වේ. (4) බාහිර පරිසරය වේ.

**2.** ව්‍යවසායකයකු විසින් පිහිටුවා ගනු ලබන පරමාර්ථවල ලක්ෂණයක් වනුයේ,
(1) නිවැරදි බවයි. (2) මැනිය හැකි බවයි. (3) අඩු පිරිවැයයි. (4) ස්ථාවර බවයි.

**3.** ව්‍යවසායකයකු සතු සමාජ වගකීම දෙයාකාරයකින් හඳුනාගත හැකි ය. එනම්,
(1) සමාජයට සහ පාරිභෝගිකයාට වගකීම ලෙස ය.
(2) ආයෝජකයන්ට සහ සමාජයට වගකීම ලෙස ය.
(3) පාරිභෝගිකයාට සහ විකුණුම්කරුට වගකීම ලෙස ය.
(4) සමාජයට සහ ණයහිමියන්ට වගකීම ලෙස ය.

**4.** වර්තමාන පරිසරය තුළ ව්‍යවසායකයකු අවධානය යොමු කළ යුතු ප්‍රධාන පරිසර ප්‍රවණතාවක් වනුයේ,
(1) ස්වාභාවික විපත් ය. (2) විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය වෙනස් වීම ය.
(3) ගනුදෙනුකරු බලවත් වීම ය. (4) දේශපාලනික වෙනස් වීම ය.

**5.** පාසල් හැරගිය අය සඳහා වෘත්තීය අධ්‍යාපන පාඨමාලා ක්‍රියාත්මක කිරීම සැලකිය හැක්කේ,
(1) ආයතනික ව්‍යවසායකත්වය ලෙස ය. (2) පාරිසරික ව්‍යවසායකත්වය ලෙස ය.
(3) සමාජයීය ව්‍යවසායකත්වය ලෙස ය. (4) නිර්මාණශීලී ව්‍යවසායකත්වය ලෙස ය.

**6.** ව්‍යවසායකයකු වීමේ ප්‍රතිලාභයක් **නොවන්නේ,**
(1) නිදහස් හා ස්වාධීන බවයි. (2) නියෝග නිකුත් කළ හැකි බවයි.
(3) වගකීම සීමා සහිත බවයි. (4) නිර්මාණශීලී විය හැකි බවයි.

**7.** ඉහළ වගකීම, කාලය සීමා සහිත බව සහ අවිනිශ්චිත අනාගතය යන සාධක ව්‍යවසායකත්වයේ ලා සැලකිය හැක්කේ,
(1) පාරිසරික සාධක ලෙස ය.
(2) අභියෝගාත්මක සාධක ලෙස ය.
(3) නිෂ්පාදන සාධක ලෙස ය.
(4) අභ්‍යන්තර සාධක ලෙස ය.

**8.** රැකියාලාභියකු සේව්‍යයාගේ තීරණ ක්‍රියාත්මක කරන අතර ව්‍යවසායකයකු,
(1) පාරිභෝගික තීරණ ක්‍රියාත්මක කරයි.
(2) සේවක තීරණ ක්‍රියාත්මක කරයි.
(3) තමාගේ තීරණ ක්‍රියාත්මක කරයි.
(4) සමාජයේ තීරණ ක්‍රියාත්මක කරයි.

[ දෙවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**9.** හොඳ වෙළෙඳපොළක් නිර්මාණය වීම ව්‍යවසායකත්වයේ,
(1) ජාතික මට්ටමේ ප්‍රතිලාභයකි. (2) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රතිලාභයකි.
(3) පුද්ගල මට්ටමේ ප්‍රතිලාභයකි. (4) සමාජයීය මට්ටමේ ප්‍රතිලාභයකි.

**10.** ව්‍යවසායකයකු අරඹන ව්‍යාපාරයක් නිසා ප්‍රතිලාභ භුක්ති විඳින ප්‍රධාන පාර්ශ්ව වනුයේ,
(1) සේවකයා, සේව්‍යයා, පාරිභෝගිකයා සහ සමාජය වේ.
(2) සේවකයා, පාරිභෝගිකයා, නිෂ්පාදකයා සහ අලෙවිකරු වේ.
(3) පාරිභෝගිකයා, ගැනුම්කරු, විකුණුම්කරු සහ සේව්‍යයා වේ.
(4) සේව්‍යයා, සමාජය, විකුණුම්කරු සහ සැපයුම්කරු වේ.

**11.** ව්‍යාපාරික අභ්‍යන්තර පරිසරයට අයත් සාධක කුලකය තෝරන්න.
(1) අයිතිකරුවන්, සංස්කෘතික පරිසරය, සේවකයින් (2) නෛතික පරිසරය, කළමනාකරුවන්, සේවකයින්
(3) කළමනාකරුවන්, ප්‍රජා පරිසරය, අයිතිකරුවන් (4) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයින්

**12.** අභ්‍යන්තර පරිසරයෙන් ව්‍යාපාර කටයුතු කෙරෙහි ඇති කරන බලපෑම් හිතකර වේ නම් එය හඳුන්වනුයේ,
(1) ශක්තියක් ලෙස ය. (2) අවස්ථාවක් ලෙස ය.
(3) ව්‍යාපාරික අභිප්‍රේරණයක් ලෙස ය. (4) ව්‍යාපාරික නිපුණතාවක් ලෙස ය.

**13.** ව්‍යවසායකත්වයේ දී අවිනිශ්චිතතාව යනුවෙන් හඳුන්වනුයේ,
(1) ප්‍රතිලාභ අඩු වීම ය.
(2) ආයෝජනයට ලැබෙන පොලිය සීමා සහිත වීම ය.
(3) ව්‍යාපාර පරිසරය සංකීර්ණ වීම ය.
(4) ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභ ස්ථිර නොවීම ය.

**14.** කුඩා ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා යොදා ගන්නා ගුණාත්මක නිර්ණායකයක් වනුයේ,
(1) සේවක සංඛ්‍යාව වේ. (2) ස්ථාවර වත්කම්වල වටිනාකම වේ.
(3) ආයෝජන ප්‍රාග්ධනයේ වටිනාකම වේ. (4) යොදාගනු ලබන කළමනාකරණ ශිල්පීය ක්‍රමය වේ.

**15.** ස්වාභාවික ආපදා අවස්ථාවල දී අවතැන් වූවන්ට සහන සැපයීම සමාජයීය ව්‍යවසායකත්වයේ,
(1) ග්‍රාමීය මට්ටමේ කාර්යයකි. (2) ප්‍රාදේශීය මට්ටමේ කාර්යයකි.
(3) ජාතික මට්ටමේ කාර්යයකි. (4) නාගරික මට්ටමේ කාර්යයකි.

**16.** යම්කිසි ගැටලුවක් සඳහා නිශ්චිත විසඳුමක් ලබාගැනීමට සියලු ම පාර්ශ්වයන්ගේ අදහස් ලබාගැනීම හඳුන්වනුයේ
(1) නිර්මාණශීලීභාවය ලෙස ය. (2) බුද්ධි කලම්බනය ලෙස ය.
(3) පරිකල්පනික චින්තනය ලෙස ය. (4) නම්‍යශීලීභාවය ලෙස ය.

**17.** විද්‍යුත්-ලිඛිත සන්නිවේදන ක්‍රමයක් සඳහා උදාහරණයක් වනුයේ,
(1) විද්‍යුත් තැපෑල ය. (2) වර්ණ සලකුණු ය.
(3) ලිපි ය. (4) දුරකථන ය.

**18.** ව්‍යාපාර කටයුතු සඳහා විකුණුම් ප්‍රවර්ධන උපදෙස් ලබාදීම හඳුන්වනුයේ,
(1) තාක්ෂණික පහසුකම් ලෙස ය. (2) අලෙවි පහසුකම් ලෙස ය.
(3) යටිතල පහසුකම් ලෙස ය. (4) උපදේශන පහසුකම් ලෙස ය.

**19.** ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන් ව්‍යාපාරයට සපයන ශ්‍රමය හඳුන්වනුයේ,
(1) පුහුණු ශ්‍රමය ලෙස ය. (2) නුපුහුණු ශ්‍රමය ලෙස ය.
(3) බුද්ධිමය ශ්‍රමය ලෙස ය. (4) කායික ශ්‍රමය ලෙස ය.

**20.** ව්‍යාපාරික තීරණ ගැනීම තුළින් ව්‍යවසායකයා ඉටු කරනුයේ
(1) අයිතිකරු ලෙස වූ භූමිකාවයි.
(2) කළමනාකරු ලෙස වූ භූමිකාවයි.
(3) නායකයා ලෙස වූ භූමිකාවයි.
(4) නිෂ්පාදකයා ලෙස වූ භූමිකාවයි.

**21.** ඒකල ස්වාමි ව්‍යාපාරයක ප්‍රධාන ලක්ෂණයක් වනුයේ,
(1) ව්‍යාපාර නාමය ලියාපදිංචිය අනිවාර්ය වීමයි.
(2) නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිගැනීමයි.
(3) කළමනාකරුවන් මගින් ව්‍යාපාර කටයුතු පාලනය වීමයි.
(4) වගකීම අසීමිත වීමයි.

[ තුන්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**22.** ලංකා බැංකුව
(1) බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. (2) බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.
(3) ලියාපදිංචි මූල්‍ය සමාගමකි. (4) ලියාපදිංචි කල්බදු සමාගමකි.

**23.** ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන සියලු ම සාධකවල එකතුව හඳුන්වනු ලබන්නේ,
(1) ව්‍යාපාර කළමනාකරණ පරිසරය ලෙස ය. (2) ව්‍යාපාර පරිසරය ලෙස ය.
(3) අභ්‍යන්තර ව්‍යාපාර පරිසරය ලෙස ය. (4) බාහිර ව්‍යාපාර පරිසරය ලෙස ය.

**24.** ව්‍යාපාර අවස්ථා ඇගයීමේ අරමුණක් වනුයේ,
(1) ප්‍රතිලාභ උපරිම කිරීම ය. (2) අවධානම මගහැරීම ය.
(3) සේවකයන් බඳවා ගැනීම ය. (4) ව්‍යාපාරයට අරමුදල් ලබා ගැනීම ය.

**25.** රජය විසින් දේශීය ව්‍යාපාර ආරක්ෂා කිරීමට විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය වෙනස් කිරීම ව්‍යාපාර කෙරෙහි බලපානුයේ,
(1) සමාජයීය හා සංස්කෘතික පරිසරය තුළින් ය. (2) ආර්ථික හා ප්‍රජා පරිසරය තුළින් ය.
(3) දේශපාලන හා නෛතික පරිසරය තුළින් ය. (4) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය තුළින් ය.

**26.** ව්‍යාපාරික කටයුතුවලින් ඉපයූ ලාභය හඳුන්වනුයේ,
(1) වත්කමක් ලෙස ය. (2) හිමිකමක් ලෙස ය.
(3) වගකීමක් ලෙස ය. (4) වගවීමක් ලෙස ය.

**27.** ව්‍යාපාරයක් ඉපයූ ශුද්ධ ලාභය ගණනය කරනුයේ,
(1) අමතර ආදායම්වලින් වියදම් අඩු කිරීමෙනි.
(2) දළ ලාභයට අමතර ආදායම් එකතු කිරීමෙනි.
(3) දළ ලාභයට අමතර ආදායම් එකතු කර විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි.
(4) දළ ලාභයට අමතර ආදායම් එකතු කර වියදම් අඩු කිරීමෙනි.

**28.** ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා වඩා වැදගත් වන කුසලතාවක් වනුයේ,
(1) ගිණුම්කරණ කුසලතාවයි. (2) කළමනාකරණ කුසලතාවයි.
(3) පාලන කුසලතාවයි. (4) ව්‍යවසායකත්ව කුසලතාවයි.

**29.** නිවාස ඉදිකිරීමේ නියැලෙන ව්‍යවසායකයකුට ගෘහ නිර්මාණ ශිල්පීන් යනු,
(1) පසුපස ව්‍යාපාරයකි. (2) ආදේශන ව්‍යාපාරයකි.
(3) ඉදිරිපස ව්‍යාපාරයකි. (4) අත්‍යවශ්‍ය ව්‍යාපාරයකි.

**30.** ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම තුළින් ලැබිය හැකි වාසියක් වනුයේ,
(1) ව්‍යාපාරයට සේවකයන් බඳවා ගැනීම පහසු වීමයි.
(2) ව්‍යාපාරයට නෛතික පිළිගැනීමක් ඇති වීමයි.
(3) ව්‍යාපාරයේ කළමනාකරණ තීරණ ගැනීම පහසු වීමයි.
(4) ව්‍යාපාරයේ සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීමයි.

**31.** නිෂ්පාදිතයක මිලත්, පිරිවැයත් අතර වෙනස වනුයේ,
(1) ලාභය වේ. (2) දායකය වේ. (3) දළ ලාභය වේ. (4) විකුණුම් පිරිවැය වේ.

**32.** ශ්‍රමයෙහි පිරිවැය වනුයේ,
(1) ආදායම වේ. (2) ලාභය වේ. (3) වැටුප් වේ. (4) පිරිවැටුම වේ.

**33.** ශේෂ පත්‍රයක දැක්වෙන ණයගැතියන් ව්‍යාපාරයේ,
(1) ජංගම නොවන වත්කමකි. (2) ජංගම වගකීමකි.
(3) ජංගම වත්කමකි. (4) ජංගම නොවන වගකීමකි.

**34.** ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ ව්‍යාපාරයේ වත්කම්, හිමිකම් සහ වගකීම් දැක්වෙන ප්‍රකාශය වනුයේ,
(1) ආදායම් ප්‍රකාශයයි. (2) ශේෂ පත්‍රයයි.
(3) මුදල් ප්‍රවාහ ප්‍රකාශයයි. (4) ව්‍යාපාර සැලසුමයි.

**35.** රු. 50 000 ක මුදලක් ණය හිමියන්ට ගෙවීම, මූලික ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරනුයේ,
(1) වත්කම් අඩුවීම රු. 50 000 වගකීම් අඩුවීම රු. 50 000
(2) වත්කම් වැඩිවීම රු. 50 000 වත්කම් අඩුවීම රු. 50 000
(3) වගකීම් අඩුවීම රු. 50 000 හිමිකම් අඩුවීම රු. 50 000
(4) වත්කම් අඩුවීම රු. 50 000 හිමිකම් වැඩිවීම රු. 50 000

[ හතරවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



* පහත සිද්ධිය කියවා අංක **36** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිරිමලී කුසලතාවලින් පිරි කාන්තාවකි. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තමා තුළ වූ සිහිනය සැබෑ කර ගනිමින් ඇය 'රන් සළු' නමින් කාන්තා ඇඟලුම් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. වෙළෙඳපොළට නිරතුරුව ම සාධාරණ මිලකට ඉහළ ගුණත්වයකින් යුත් නව විලාසිතා ඉදිරිපත් කිරීම නිසා ඇයගේ නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම දිනෙන් දින ඉහළ යන ලදී. අද වන විට තම ව්‍යාපාරයේ සාර්ථකත්වය පිළිබඳ ඇය ඉතා සතුටින් පසුවන්නී ය.

**36.** වෙළෙඳපොළට නව විලාසිතා ඉදිරිපත් කිරීමෙන් සිරිමලී පෙන්නුම් කරන ව්‍යවසායකත්ව ලක්ෂණ මොනවා ද?
(1) වෙළෙඳපොළ විශ්ලේෂණය සහ නව්‍යතා සම්පාදනය
(2) කැපවීම සහ නායකත්වය
(3) වෙළෙඳපොළ විශ්ලේෂණය සහ අවදානම් භාර ගැනීම
(4) නිර්මාණශීලීත්වය සහ නව්‍යතා සම්පාදනය

**37.** සිරිමලී කාන්තා ව්‍යවසායිකාවක් වීම ව්‍යවසායකත්වයේ ලා
(1) ශක්තියකි. (2) දුර්වලතාවයකි. (3) අවස්ථාවකි. (4) අභියෝගයකි.

**38.** "අද වන විට තම ව්‍යාපාරයේ සාර්ථකත්වය පිළිබඳ ඇය ඉතා සතුටින් පසුවන්නී ය." මෙය සැලකිය හැක්කේ ව්‍යවසායකත්වයේ,
(1) මූල්‍යමය ප්‍රතිලාභයක් ලෙස ය. (2) මානසික තෘප්ත ප්‍රතිලාභයක් ලෙස ය.
(3) සමාජයීය ප්‍රතිලාභයක් ලෙස ය. (4) ආර්ථික ප්‍රතිලාභයක් ලෙස ය.

**39.** සිරිමලී තම වෙළෙඳපොළ ඛණ්ඩනයට යොදා ගෙන ඇති පදනම වනුයේ,
(1) ස්ත්‍රී පුරුෂභාවයයි. (2) වයස් ව්‍යුහයයි.
(3) සමාජ පසුබිමයි. (4) ආදායමයි.

**40.** සිරිමලී සාධාරණ මිලකට ගුණත්වයෙන් ඉහළ ඇඟලුම් අලෙවි කිරීම සැලකිය හැක්කේ,
(1) ව්‍යාපාර නීතියක් ලෙස ය.
(2) ව්‍යාපාර ආචාර ධර්මයක් ලෙස ය.
(3) ව්‍යාපාර අරමුණක් ලෙස ය.
(4) ව්‍යාපාර දැක්මක් ලෙස ය.

**

[ පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

| | |
|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II |
| முயற்சியாண்மைக் கற்கை | I, II |
| Entrepreneurship Studies | I, II |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා **(i)** සිට **(x)** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාසල් අධ්‍යාපනය අවසන් කළ සිරිමල්ට රැකියාවක අවශ්‍යතාව දැඩිව දැනුන ද ඔහුගේ බලාපොරොත්තුව වූයේ තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කර, තමාට මෙන් ම සමාජයට ද යහපතක් කිරීම ය. එහෙත් සිරිමල්ගේ ව්‍යාපාරයේ ආරම්භක අවධිය ඉතාමත් දුෂ්කර විය. අවශ්‍ය අමුද්‍රව්‍ය හා ඒවා ඇති ප්‍රදේශ සොයා ගැනීම, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දී ඉහළ මිලක් ගෙවීමට සිදුවීම, තම නිෂ්පාදන වෙළෙඳපොළට හඳුන්වාදීම යනාදී ගැටලු සිරිමල්ට දැඩි ව දැනෙන්නට විය. භාණ්ඩ ප්‍රවාහනය කිරීමට ඇති දුෂ්කරතාව, මුදල් හිඟකම වැනි දේ සිරිමල්ව තව තවත් අපහසුතාවයට පත් කළේය. ආරම්භක අවධියේ දී ඔහුට පාඩු විඳීමට පවා සිදු වුනි. අපමණ බාධා පැමිණිය ද සිරිමල් ඉන් නොසැලුණි. බාධක, අභියෝග ලෙස සැලකූ සිරිමල් ඒවා ජය ගැනීමට දිනෙන් දින උපක්‍රම සෙව්වේය. ආරම්භයේ දී යෙදූ ප්‍රාග්ධනය ද ප්‍රමාණවත් නොවූ බැවින්, කෙසේ හෝ තම ව්‍යාපාරයට මුදල් යෙදවිය යුතු යැයි සිතූ සිරිමල් සංවර්ධන බැංකුවෙන් ණය මුදලක් ලබාගෙන ව්‍යාපාරයේ ආයෝජනය කරන ලදී. නිර්මාණශීලිව, හොඳ නිමාවකින් යුත් භාණ්ඩ වෙළෙඳපොළට හඳුන්වා දීම නිසා ඔහුගේ නිෂ්පාදන සඳහා ඉල්ලුම දිනෙන් දින වැඩි විය. තම නිෂ්පාදන අලෙවියෙන් ලැබෙන ලාභය ද ඔහු ව්‍යාපාරයේ නැවත ආයෝජනය කළේ ය.

මේ අතරතුර ව්‍යවසායකත්ව දැනුම වැඩිකර ගැනීමේ අදහසින් සිරිමල් සංවර්ධන බැංකුවේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු පාඨමාලාවකට සහභාගි විය. එම පාඨමාලාව අවසානයේ සිරිමල් දැක්වූ අදහස වූයේ, ව්‍යාපාරයක් සාර්ථකව කරගෙන යාමට ව්‍යවසායකයකු බොහෝ දේ දැනගත යුතු බවයි. ඒ අතර ව්‍යාපාරය සම්බන්ධව හොඳ අවබෝධයක් තිබීම, ව්‍යාපාරයේ ආදායම් හා වියදම් ද, ලාභය හා පිරිවැය ද පිළිබඳ මනා අවබෝධයක් තිබීම, අදට ගැළපෙන ලෙස නිෂ්පාදනය කිරීම සහ තරගකාරී වෙළෙඳපොළ තුළ ව්‍යාපාර කටයුතු කළ යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ දැනුම ව්‍යවසායකයකුට ඉතා වැදගත් බව ඔහුගේ අදහස විය.

(i) සිද්ධියේ දැක්වෙන පරිදි සිරිමල් තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ කුමක් ද?
(ii) ව්‍යවසායකයකු ලෙස සිරිමල් තුළ දැකිය හැකි ව්‍යවසායකත්ව ලක්ෂණ **දෙකක්** දක්වන්න.
(iii) ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේ දී සිරිමල් මුහුණ දුන් අභියෝග **දෙකක්** සඳහන් කරන්න.
(iv) ව්‍යාපාරයක් සාර්ථක කර ගැනීම සඳහා ව්‍යවසායකයකු දැනගත යුතු කරුණු **දෙකක්** ලියන්න.
(v) ව්‍යාපාරයක් සඳහා මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** දක්වන්න.

● සිරිමල්ගේ ව්‍යාපාරයේ පළමු වසර අවසානයේ දී පොත්වල සටහන් ව තිබූ ගනුදෙනු කිහිපයක් පහත වේ.

| | රු. |
|---|---|
| සිරිමල් ආයෝජනය කළ මුදල | 100 000 |
| සංවර්ධන බැංකුවෙන් ගත් ණය මුදල | 200 000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 100 000 |
| වැටුප් ගෙවීම් | 50 000 |
| අනෙකුත් වියදම් | 72 000 |
| විකුණුම් | 325 000 |

(vi) සිරිමල්ගේ ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද?
(vii) බැංකුවෙන් ලබාගත් ණය මුදල, මූලික ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරන ආකාරය දක්වන්න.
(viii) පළමු වසර අවසානයේ සිරිමල්ගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය දක්වන්න.
(ix) සිරිමල්ගේ ව්‍යාපාරයේ ගනුදෙනුවලට අදාළ මූලික පොතක් සඳහන් කරන්න.
(x) පළමු වසර අවසානයේ සිරිමල්ගේ ලාභය ගණනය කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

[ හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



Agaram.lk - Keep your dreams alive !

**2.** (i) 'ව්‍යවසායකයා' යන්න ඔබේ වචනයෙන් පහදන්න.
(ii) ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ සහ පිරිවැය **දෙක** බැගින් වෙන වෙන ම දක්වන්න.
(iii) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි බලපාන අභියෝග **දෙකක්** සඳහන් කරන්න.
(iv) ව්‍යවසායකයකු සතුවිය යුතු කුසලතා **දෙකක්** දක්වන්න.
(v) ව්‍යවසායකත්ව සංවර්ධනයට පහසුකම් සලසන ආයතන **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

**3.** (i) ව්‍යවසායකයකුට, හොඳ ව්‍යාපාර දැක්මක් වැදගත් වන්නේ ඇයි?
(ii) ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන සමාජයීය ව්‍යවසායකත්ව කාර්යයන් **දෙකක්** දක්වන්න.
(iii) ව්‍යවසායකයකු, කළමනාකරුවකුගෙන් වෙනස් වන කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(iv) ව්‍යාපාර සැලැස්මකින් ඇති ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.
(v) අනෙකුත් සම්පත්වලට සාපේක්ෂව ආයතනයකට මානව සම්පත සුවිශේෂී වීමට හේතු **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

**4.** (i) 'ව්‍යාපාර බාහිර පරිසරය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) කාන්තාවන් ව්‍යවසායකත්ව කාර්යය සඳහා යොමු වීම තුළින් ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න.
(iii) කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි බලපාන අභියෝග **දෙකක්** දක්වන්න.
(iv) කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
(v) බෙදා හැරීමේ මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

**5.** (i) පාරිභෝගිකයා පෙලඹවීම සඳහා යොදාගත හැකි ප්‍රවර්ධන ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(ii) ඉලක්ක පාරිභෝගික කණ්ඩායමක් තෝරා ගැනීම තුළින් ව්‍යවසායකයකුට ලැබිය හැකි ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.
(iii) සාරංගි කාන්තා පාවහන් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඇයට තම නිෂ්පාදිතය සඳහා වෙළෙඳපොළ බණ්ඩනය කිරීමට යොදාගත හැකි ජන විකාශන සාධක **හතරක්** සඳහන් කරන්න.
(iv) නිෂ්පාදිතයක මිල තීරණය කිරීමේ දී සලකා බලන සාධක **දෙකක්** දක්වන්න.
(v) පාරිභෝගික හැසිරීම තීරණය කරනු ලබන සාධක **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

**6.** (i) 'කාරක ප්‍රාග්ධනය' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
(ii) වෙළෙඳ කටයුතුවල දී දැකිය හැකි නියෝජිතයන් වර්ග සඳහන් කරන්න.
(iii) ඉන්වොයිස් අංක 551 යටතේ එකක් රු. 1 000 බැගින් ඔරලෝසු 50 ක් අනුරගෙන් මිල දී ගැනීම මෙම ගනුදෙනුවට අදාළ මූලික ලියවිල්ල කුමක් ද?
(iv) ඉහත (iii) හි ගනුදෙනුවට අදාළ මූලික පොත කුමක් ද?
(v) මුලාශ්‍ර ලේඛනවලින් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි)

**7.** සංකලන ව්‍යාපාරයේ 2015.01.01 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තොගය | 60 000 |
| මුදල් | 50 000 |
| ප්‍රාග්ධනය | 320 000 |
| මෝටර් රථ | 200 000 |
| ණයගැතියන් | 10 000 |

ජනවාරි මස සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| විදුලි ගාස්තු | 35 000 |
| ගැනුම් | 105 000 |
| විකුණුම් | 250 000 |
| සේවක වැටුප් ගෙවීම් | 40 000 |
| ලබාගත් බැංකු ණය | 100 000 |
| ණය පොලී | 1 500 |
| වෙනත් ආදායම් | 85 000 |
| අවසන් තොගය (2015.01.31 දිනට) | 75 000 |

**අවශ්‍ය වන්නේ :**

(i) 2015.01.31 දිනට සංකලන ව්‍යාපාරයේ මුදල් ශේෂය (ලකුණු 05 යි)
(ii) 2015.01.31 දිනෙන් අවසන් මාසය සඳහා සංකලන ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය (ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

* * *

agaram.lk